| මතුගම අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන | | |
| 7 ශ්‍රේණිය | සත්ත්ව විවිධත්වය | ඒකකය - 06 |

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1) පහත සඳහන් සතුන් අතරින් අපෘෂ්ඨවංශී සත්වයෙක් වන්නේ,

I) කැස්බෑවා II) පිඹුරා III) ගොළුබෙල්ලා IV) මැඩියා

2) පහත සතුන් අතරින් පෘෂ්ඨවංශී සත්වයකු වන්නේ,

I) පසැගිල්ලා II) මාළුවා III) හැකරැල්ලා IV) ගැඩවිලා

3) පෘෂ්ඨවංශීන් , අපෘෂ්ඨවංශීන්ගෙන් වෙනස් වන පොදු ලක්‍ෂණය වන්නේ පෘෂ්ඨවංශීන්ට ,

I) ස්නායු පද්ධතියක් තිබීම II) කොඳු ඇට පෙළක් තිබීම

II) දියුණු ඇස් තිබීම IV) දියුණු ආහාර ජීර්ණ පද්ධතියක් තිබීම

4) පෘෂ්ඨවංශීන්ට අයත් සතුන් සිටින සත්ත්ව කාණ්ඩය වනුයේ,

I) කෘමීන් II) සන්ධිපාදකයින් III) මෘද්වංශින් IV) ක්ෂීරපායීන්

5) තල්මසා පහත සඳහන් කුමන පෘෂ්ඨවංශි කාණ්ඩයට අයත්ද?

I) උභය ජීවීන් II) මත්ස්‍යයින් III) ක්ෂීරපායින් IV) උරගයින්

6) ක්ෂීරපායි සත්වයකු වන්නේ,

I) මෝරා II) කැස්බෑවා III) උකුස්සා IV) වවුලා

7) මුහුදු වෙරළ ආශ්‍රිතව සිටින සත්වයකු වන්නේ,

I) පැසැගිල්ලා II) ආඳා III) ලූලා IV) මෝරා

8) මලක් මත සිටීමට වඩාත් හොඳින් අනුවර්තනය වී ඇති සත්වයෙක් වන්නේ,

I) තණකොළපෙත්තා II) සළඹයා III) සමනලයා IV) ජේර කොළයා

9) දුඹුරු පැහැති ශරීර වර්ණය දිවියාට වඩාත් උපකාරි වන්නේ ,

I) තම විලෝපිකයන්ගෙන් ආරක්ෂා වීමට

II) තම ගොදුරු අල්ලා ගැනීමට නොපෙනෙන සේ සිටීමට

III) තම පැටවුන් සඟවා තබා ගැනීමට

IV) ශරීරය පවිත්‍රව තබා ගැනීමට

10) අනාකුල හැඩයක් ඇති සත්ත්ව විශේෂයක් වන්නේ,

I) මාළුවා II) අලියා III) කකුළුවා IV) පත්තෑයා

e-තක්සලාව The National e-learning Portal for The General Education

# B කොටස - රචනා

පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1) I) සතුන් බෙදිය හැකි ප්‍රධාන කාණ්ඩ දෙක මොනවාද?

II) එම කාණ්ඩ වලට වර්ග කිරීම සඳහා පදනම් වූයේ කුමක්ද?

III) සතුන් කාණ්ඩ කිරීමට යොදාගත හැකි අනෙකුත් නිර්ණායක මොනවාද?

IV) සතුන් කාණ්ඩ වලට වෙන් කිරීමේ ප්‍රයෝජන දෙකක් ලියන්න.

V) පහත දක්වා ඇති සතුන් පෘෂ්ඨවංශී හා අපෘෂ්ඨවංශීන් ලෙස කාණ්ඩ වලට වර්ග කරන්න.
හැකරැල්ලා,පසැගිල්ලා,මාළුවා,වවුලා,පිඹුරා,තාරාවා,සමනලයා,මිනිසා,කැස්බෑවා,ගොළුබෙල්ලා,ගැඩවිලා
කපුටා,කකුළුවා,අලියා,මැඩියා

2) I) පෘෂ්ඨවංශීන් තවදුරටත් බෙදා දැක්විය හැකි කාණ්ඩ පහ මොනවාද?

II) එක් එක් කාණ්ඩයට අයත් සතුන් තුන් දෙනෙකු බැගින් නම් කරන්න.

III) ජීවීන් ජීවත් වන විවිධ පරිසර මොනවාද? එම පරිසර සඳහා උදාහරණ දෙන්න.

3) සතුන්ගේ සමහර ලක්ෂණ යම්කිසි පරිසරයක ජීවත්වීම පහසු කරයි. ජීවීන් තම පරිසරයට දක්වන හැඩගැසීම් අනුවර්තන නම් වේ.

I) පහත ජීවීන් යම්කිසි පරිසරයක ජීවත් වීමට හැඩ ගැසී ඇති ආකාරය (අනුවර්තන) සඳහන් කරන්න.

a) පේර කොළ වන්දා    b) කෝටු වන්දා

c) කටුස්සා    d) දළඹුවා

e) ගිරවා

II) වේශාන්තරණය යනු කුමක්ද?

III) වේශාන්තරණය නිසා සතුන්ට ලැබී ඇති වාසි දෙකක් ලියන්න.

IV) දිවියාගේ ශරීරය දුවිලි පැහැති වීම හා පුල්ලි පිහිටීම ඔවුන්ට ප්‍රයෝජනවත් වන්නේ කෙසේද?

4)



a) බණ්ඩක්කා කරල් දෙකක අග කොටස්    b) බණ්ඩක්කා කරලේ මැද කොටස

ඉහත ලෙස බණ්ඩක්කා කරලේ අග සහ මැද කොටස් ක්ලේ ගුලියක් ගැට ගසා එකම වේලාවේ ජලය පිරුණු තැටියක තබන්න.

I) "a" හා "b" කොටස් තැටියේ තබන ආකාරය අඳින්න.

II) බණ්ඩක්කා කොටස්වලින් ජලයේ වේගයෙන් ගමන් කරන්නේ කුමන කොටස ද?

III) වේගයෙන් ගමන් කළ බණ්ඩක්කා කොටසේ හැඩය හැඳින්විය හැකි නම කුමක් ද?

IV) එම හැඩය සහිත සතුන් දෙදෙනෙකු නම් කරන්න.

V) එම හැඩය සතුන්ට ප්‍රයෝජනවත් වන්නේ කෙසේද?